# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2137/7 - 2019 අගෝස්තු මස 19 වැනි සඳුදා - 2019.08.19**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

*මගේ අංකය* : IR/22/70/2009

### කාර්මික ආරාවුල් පනත - 131 වැනි අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2011.08.02 දිනැති හා අංක 1717/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2011.07.18 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කුරුණෑගල, කුඩා ගල්ගමුව, වැව රවුම් පාර හි පදිංචි ඒ. එම්. ජේ. අතපත්තු මයා සහ කොළඹ 05, කිරුළ පාර, අංක 200හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2019.06.27 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 අගෝස්තු මස 09 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

*යොමු අංකය* : IR/22/70/2009

කාර්මික අධිකරණය

ඒ. එම්. ජේ. අතපත්තු මයා,
වැව රවුම් පාර,
කුඩාගල්ගමුව,
කුරුණෑගල.

*පළමු පාර්ශවය*

නඩු අංකය : A 3396

*සහ*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
අංක 200, කිරුළ පාර,
කොළඹ 05.

*දෙවන පාර්ශවය*

අතර පවත්නා කාර්මික ආරාවුල

**ප්‍රදානය**

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගාමිණී ලොකුගේ මැතිතුමා විසින් වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962


1 A – G 30743— 38 (2019/08)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

අංක 4 සහ 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වගන්තිය යටතේ කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමාට පැවරී ඇති බලතල ප්‍රකාරව උක්ත ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා 2011.07.18 දිනැති නියෝගයෙන් බේරුම්කරුවෙකු වශයෙන් මා පත්කොට මා වෙත යොමුකර ඇත.

### ආරවුලට තුඩුදුන් කාරණය

බේරුම්කරණය සඳහා මා වෙත යොමු කොට ඇති උක්ත නියෝගය ප්‍රකාරව ඉහත සඳහන් දෙපාර්ශවය අතර උද්ගත වී ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කාරණය ලෙස සීමාසහිත වයඹ බස් සමාගමේ සේවය කළ ඒ. එම්. ජේ. අතපත්තු මහතා කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක 63773/01 හා 2005.07.19 දිනැති නියෝගය අනුව ඔහු සියලු චෝදනා වලින් නිදහස් කිරීම මත, 2002 ජූනි මස සිට 2003 ජූනි මස දක්වා වැටුප් රහිතව හා 2003 ජූලි මස සිට 2003 දෙසැම්බර් මස දක්වා අඩ වැටුප් සහිතව සිටි කාලසීමාවට හිඟ වැටුපක් සඳහා හිමිකම ලබන්නේ ද යන්න හා හා හිමිකම් ලබන්නේ නම් ඔහුට යම් අසාධාරණයක් සිදුවී ඇත් ද ? එසේ අසාධාරණයක් සිදුවී ඇත්නම් හිමි විය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ.

### පසුබිම

ඉල්ලුම්කරු විසින් වර්ෂ 2011.08.18 වැනි දින කාර්මික අධිකරණය වෙත පිටපත් 03ක් සහිතව විස්තර ප්‍රකාශයක් ඉදිරිපත් කරන ලද අතර ඉල්ලුම් පත්‍රය සමඟ ඇමුණුම් 11ක් ද ගොනු කර ඇත. ඉල්ලුම්කරු ඉල්ලා සිටින්නේ වේතන රහිතව සේවා තහනම්ව සිටි කාලය වූ 2002 ජූනි මස සිට 2003 ජූලි දක්වා රුපියල් එක්ලක්ෂ තිස්පන්දහස් හත්සිය විස්ස (රු. 135,720)ක් ද අර්ධ වේතන සහිතව සේවය තහනම් කර සිටි කාලය වූ 2003 ජූලි මස සිට දෙසැම්බර් දක්වා රුපියල් තිස්දහස් එකසිය විස්ස (රු. 30,120)ක මුදලක් අසාධාරණ ලෙස අහිමි කිරීම නිසා ලැබිය යුතු මුළු හිඟ වැටුප වූ රුපියල් එක්ලක්ෂ හැටපන්දහස් අටසිය හතලිහ (රු. 165,840)ක මුදල ලබා දෙන ලෙසයි.

වගඋත්තරකරුවන් ද 2011 අගෝස්තු මස 18 දාතමින් යුතුව පිළිතුරු ප්‍රකාශය ගොනු කරමින් මූලික විරෝධතාවයක් ද නගන ලදී. මූලික විමසීම 2011.09.27 වැනි දින අරඹන ලද අතර එම අවස්ථාවේදී ඉල්ලුම්කරුගේ ගණනයන් පිළිබඳව නිවැරදි කරන ලෙස ඉල්ලීමක් කරන ලදී. ඉල්ලුම්කරුගේ පළමු ප්‍රකාශයේ ඇමුණුම් 10 හා ඇමුණුම් 06 දක්වා කරුණු සඳහන් කරන ලදී.

වගඋත්තරකරුවන්ගේ නීතිඥවරිය වැඩිදුර විමසීම් සඳහා දින අයදින ලදී. 2011.11.18 වැනි දින ඉල්ලුම්කරු පෞද්ගලිකව පෙනී සිට අතර ඉ1 සිට ඉ9 දක්වා ලේඛන ලකුණු කරමින් මූලික සාක්ෂි දෙන ලදී. තවදුරටත් සාක්ෂි දෙමින් දින 35ක් රක්ෂිත බන්ධනාගාර ගත වී සිටි බවත් කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරූ බවත් මේ අතරතුර දී 2002.06.06 ලිපිය මගින් වැඩ තහනම් කළ බවත් තවදුරටත් දන්වා සිටියේ ය. 2011.12.08 වැනි දින වැඩිදුරටත් සාක්ෂි දෙන ලදී. 2012.01.08 වැනි දින ඉල්ලුම්කරු විසින් ඉ1 සිට ඉ30 දක්වා ලේඛන ලකුණු කරමින් ඉල්ලුම්කරුගේ නඩුව අවසන් කරන ලදී.

2012.02.09 වැනි දින වගඋත්තරකරුවන් වෙනුවෙන් හරස් ප්‍රශ්ණ ඇසීමට තිබුනු දිනයේ දී නීතිඥ විශ්ව ලිවේරා තෙන්නකෝන් මහතා සමථයක් සඳහා සලකා බැලීම සඳහා දිනයක් අයදින ලද අතර ඉල්ලුම්කරු ද ඊට විරුද්ධත්වයක් නොවිය. හරස් ප්‍රශ්න වලදී ගෘහස්ථ විනය පරීක්ෂණය සම්බන්ධයෙන් විනය නියෝගය පිළිගෙන කටයුතු කළ බවට ඉදිරිපත් කළ යෝජනාව ඉල්ලුම්කරු ප්‍රතික්ෂේප කරන ලද අතර කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ 63773/01 ඉල්ලුම්කරු විසින් ඉ21 ලෙස නම් කර ඇති ලේඛනය වගඋත්තරකාර පක්ෂය වා1 ලෙස නම් කරන ලදී.

ඉල්ලුම්කරු විසින් ලිඛිතව විනය පරීක්ෂණය කඩිනම් කරන ලෙසත් මණ්ඩලයේ නොවන වෙනත් නිලධාරියෙකු ඒ සඳහා පත් කරන ලෙසත් එකී ඉල්ලීම අනුව කටයුතු නොකරන ලද බව තහවුරු කරන ලදී. දින කිහිපයක් වගඋත්තරකාර පක්ෂය ඉල්ලුම්කරුගෙන් හරස් ප්‍රශ්න අසන ලදී. 2011.11.06 වැනි දින වගඋත්තරකරුවන් වෙනුවෙන් ජේ. බී. ජයසුන්දර මහතා 2013.02.19 වැනි දින විමසීමේදී ජේ. එම්. ජයසූරිය මහතා විශ්‍රාම ගොස් ඇති බැවින් වයඹ ප්‍රාදේශීය ධාවන කළමනාකරු ප්‍රියදර්ශන මහතා සාක්ෂියට කැඳවන ලදී.

2013.09.13 වැනි දින ඉල්ලුම්කරු පෞද්ගලිකව පෙනී සිටිය ද වගඋත්තරකරුවන් වෙනුවෙන් පෙර දින සාක්ෂි දුන් සාක්ෂිකරු පැමිණි නොසිටියෙන් විමසීම 2013.10.10 දිනට යොදා ගත් අතර එදින සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න අසන ලදී. සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න ඇසීම 2014.10.30 වැනි දන අවසන් වූ අතර නැවත ප්‍රශ්න සඳහා 2014.12.03 වැනි දින කැඳවන ලදී. දෙපාර්ශවය විසින් 2015.02.20 වැනි දිනට පෙර ලිඛිත දේශන ගොනු කළ යුතු බවට දැන්වීමෙන් අනතුරුව ඉල්ලුම්කරු විසින් 2015.02.16 වැනි දින පිටු 20න් සමන්විත ලිඛිත දේශනයක් ද වගඋත්තරකරුවන් වෙනුවෙන් 2015.02.06 වැනි දින පිටු 03න් සමන්විත ලිඛිත දේශනයක් ද ගොනු කර ඇත.

### නීතිමය කරුණු

නඩුවේ පාර්ශවකරුවන් විසින් ඉදිරිපත් කෙරුණු සාක්ෂිත්, ඉදිරිපත් කරන ලද ලේඛනත් සලකා බැලීමේදී ඉල්ලුම්කරු සම්බන්ධයෙන් වගඋත්තරකාර පක්ෂය අනුගමනය කර ඇති ක්‍රියා පිළිවෙත ගමනාගමන මණ්ඩලයේ විනය නීති රීති පිළිගත් සම්ප්‍රදයන් සහ නීතිමය මූලධර්ම අනුගමනය කර ඇත්දැයි සලකා බැලිය යුතු ය.

ඉල්ලුම්කරුගේ ඉල්ලීම වන්නේ ඔහුට එරෙහිව අල්ලස් චෝදනාවක් යොමුකොට එම නඩුව නිෂ්ප්‍රභා කිරීමෙන් පසුව ගමනාගමන මණ්ඩලයේ විනය නීති මාලාව අනුව විනය විරෝධි කටයුත්තක යෙදීම සම්බන්ධයෙන් වැරදි සහගත ක්‍රියා මාර්ගයක් අනුගමනය කර ඇතැයි යන්නයි. නඩු විභාගයේ දී හෙළිදරව් වූ කරුණු සලකා බැලීමේදී වගඋත්තරකාර පක්ෂය විසින් අනුගමනය කර ඇති ක්‍රියා පද්ධතිය දෝෂ සහිත බව පැහැදිළි වේ. ඉල්ලුම්කරු කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු විභාගයෙන් පසුව සියලුම චෝදනාවලින් නිදහස් කරන ලදී. කෙසේ නමුත් වයඹ ගමනාගමන මණ්ඩලයේ විනය මණ්ඩලය විසින් කරන ලද අභ්‍යන්තර පරීක්ෂණය පිළිගත් නීතිමය මූල ධර්මවලට පටහැනිව කරන ලද බවට කරුණු

හෙළිදරව් වේ. තවද විනය විභාගයට විරුද්ධව අභියාචනය කළ නොහැකි බවට නව මූලධර්මයක් හෙළිදරව් කිරීමට උත්සහා දරා ඇත. කෙසේ නමුත් උසාවි නියෝගයෙන් පසුව අභ්‍යන්තර විනය පරික්ෂණයට විරුද්ධව අභියාචනය කිරීමට ඉඩ සලසා ඇත.

**ප්‍රදානය**

මා ඉදිරියේ දී පවත්වන ලද සමස්ථ විමසීම් මාලාව සැලකිල්ලට ගැනීමේදී ඉල්ලුම්කරු තමන් වෙනුවෙන් පෞද්ගලිකව පෙනී සිටි අතර වගඋත්තරකාර පක්ෂය රජයේ අධිනීතිඥයන් හා නීතිඥයන් මාර්ගයෙන් විමසීමට සහභාගී වී ඇත. නඩු කටයුතු දිගින් දිගටම කල්යාමට මූලිකව හේතුව වූයේ වගඋත්තරකාර පක්ෂය දින ලබා ගැනීමයි. දුර බැහැර සිට විභාගයට පැමිණි ඉල්ලුම්කරුගේ ස්ථාවරය ඔහුගේ සාක්ෂි සහ ඉදිරිපත් කරන ලද ලේඛන අනුව පිළිගැනීමට සාධාරණ හේතු තිබේ. ඉල්ලුම්කරු කෙරෙහි වගඋත්තරකාර පක්ෂය බොහෝ විට ක්‍රියා කර ඇත්තේ ද්වේශ සහගත ආකාරයෙනි.

පැමිණිලි පක්ෂය විසින් ඉල්ලීමට අදාලව ඉදිරිපත් කළ කරුණු අනුව පැහැදිලි වන්නේ ඉල්ලුම්කරුගේ ආයාචනය පරිදි ඔහුගේ ඉල්ලීම් ලබාදීම සාධාරණ හා යුක්ති සහගත බවයි.

1) මේ අනුව ඉල්ලුම්කරුගේ ඉල්ලීම වූ වේතන රහිතව සේවා තහනම් සිටි කාලය වන වර්ෂ 2002 ජූනි මස සිට වර්ෂ 2003 ජූලි දක්වා රු. 135,720ක් හා අර්ධ වේතන සහිතව සේවය තහනම් කර සිටි කාලය වූ 2003 ජූලි මස සිට දෙසැම්බර් මාසය දක්වා කාලය තුළ රු. 30,120ක් මුදලක් එනම් මුලු හිඟ වැටුප වූ රුපියල් එක්ලක්ෂ හැටපන් දහස් අටසිය හතලිහ (රු. 1,65,840) ක මුදල මෙම ඉල්ලුම්කරුට ලබාදෙන ලෙස නියෝග කරමි.

2. නඩු ගාස්තු වශයෙන් ඉල්ලුම්කරුට රුපියල් හැත්තෑ පන්දහස (රු. 75,000)ක් බැගින් නඩු ගාස්තු ද හිමි විය යුතු බවට තීරණය කරමි.

**සටහන**

මෙම නඩුවේ විභාග කටයුතු අවසන් වුවද ප්‍රදනයක් කිරීමට කල්ගත වූයේ අතිශයින්ම පෞද්ගලිකව පැවති බලවත් අවිවේකී තත්ත්වයක් හා කාර්ය බහුලතාවයක් නිසා බැව් සඳහන් කරමි. එකී හේතු මත ප්‍රමාදය සම්බන්ධයෙන් බලවත සේ කණගාටුවට පත් වෙමි.

එස්. එම්. එස්. ජයවර්ධන,
බේරුම්කරු,

2019.06.27 වැනි දින,
කාර්මික අධිකරණයේ දී ය.

09 - 14

---

*මගේ අංකය* : IR/13/09/2009

**කාර්මික ආරාවුල් පනත - 131 වැනි අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික අරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2011.10.28 දිනැති හා අංක 1729/22 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2011.10.20 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කුරුවිට, අලුත් මල්කඩුවාව, හිග්ගස්හේන, ''පුෂ්පසිරි'' හි පදිංචි ඒ. එම්. ඩී. ජී. ධනුෂ්ක මයා සහ කොළඹ 03, ආර්. ඒ. ද මෙල් මාවත, අංක 10හි පිහිටි රෝයල් පෝසිලේන් (පුද්ගලික) සමාගම අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2019.06.27 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 අගෝස්තු මස 09 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

*යොමු අංකය* : IR/13/09/2009

කාර්මික අධිකරණය

ඒ. එම්. ඩී. ජී. ධනුෂ්ක මහතා,
''පුෂ්පසිරි'',
හිග්ගස්හේන,
අලුත් මල්කඩුවාව,
කුරුවිට.

නඩු අංකය : A 3413

*පළමු පාර්ශවය*

*සහ*

රෝයල් පෝසිලේන් (පුද්ගලික)
සමාගම,
අංක 10, ආර්. ඒ. ද මැල් මාවත,
කොළඹ 03.

*දෙවන පාර්ශවය*

අතර පවත්නා කාර්මික ආරවුල

**ප්‍රදානය**

කම්කරු හා වෘත්තිය සමිති සබඳතා අමාත්‍ය ගාමිණී ලොකුගේ මැතිතුමා විසින් වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 4 සහ 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත් වලින්

සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වගන්තිය යටතේ කම්කරු හා වෘත්තිය සමිති සබඳතා අමාත්‍යතුමාට පැවරී ඇති බලතල ප්‍රකාරව උක්ත ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා 2011.10.20 දිනැති නියෝගයෙන් බේරුම්කරුවෙකු වශයෙන් මා පත්කොට මා වෙත යොමුකර ඇත.

### ආරවුලට තුඩුදුන් කාරණය

බේරුම්කරණය සඳහා මා වෙත යොමු කොට ඇති උක්ත නියෝගය ප්‍රකාරව ඉහත සඳහන් දෙපාර්ශවය අතර උද්ගත වී ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කාරණය ලෙස හොරණ, මූනගම, මිදෙල්ලමුලහේන ලිපිනයේ පිහිටි රෝයල් පෝසිලේන් (පුද්ගලික) සමාගමේ 2004 දෙසැම්බර් මස සිට නිෂ්පාදන ඉංජිනේරුවරයෙකු ලෙස සේවය කර ඇති ඒ. එම්. ඩී. ජී. ධනුෂ්ක මහතා (ඉල්ලුම්කරු) 2008.04.17 දින සේවයෙන් ඉල්ලා අස්වී ඇතත් 2007 වසරට හිමි බෝනස් මුදලින් නොගෙවූ ඉතිරි අඩ මුදල වන රු. 52,500/- මුදල ආයතනය විසින් නොගෙවීමෙන් ඔහුට යම් අසාධාරණයක් සිදුවී ඇත් ද ? එසේ අසාධාරණයක් සිදුවී ඇත්නම් හිමි විය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ.

### පසුබිම

ඉල්ලුම්කරු විසින් 2011.11.18 වැනි දින අතින් ලියන ලද පිටු තුනහමාරකින් සමන්විත ඉල්ලීමක් කාර්මික අධිකරණයට යොමු කර ඇත. තවද එම ඉල්ලීම සමග ඉල්ලා අස්වීමේ ලිපිය එය භාරගත් බවට වගඋත්තරකාර සමාගමේ එවූ ලිපිය පානදුර සහකාර කොමසාරිස් තුමාගේ නිර්දේශය ජී. මදනායක සහකාර කොමසාරිස් තුමාගේ ලිපිය ද අමුණා ඇත. වගඋත්තරකාර පක්ෂය 2011.11.20 වැනි දින පිළිතුරු ප්‍රකාශයක් කරන ලද අතර 2012.01.15 වැනි දින ඉල්ලුම්කරු විසින් පිළිතුරු ප්‍රකාශය ද ඉදිරිපත් කරන ලදී.

2012.03.21 වැනි දින විමසීම අරඹන අවස්ථාවේදී වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් මානව සම්පත් කළමනාකරු මහීල අසංක මහතා 2012.03.20 වැනි දින නොතිසි ලැබුණු බවත් සූදනම් වීමට වේලාවක් නොතිබුණු බැවින් 2012.04.03 වැනි දිනට නියම කරන ලදී. 2012.04.03 වැනි දින විමසීම ආරම්භ කරන ලද අතර ඉල්ලුම්කරු සාක්ෂි දෙමින් කියා සිටියේ 75%ක් ගෙවනවා නම් සමථයකට පත්විය හැකි බවයි. පසුව වගඋත්තරකාර පාර්ශවය දිගින් දිගටම හරස් ප්‍රශ්න අසන ලදී.

වගඋත්තරකාර පාර්ශවය 2012.7.17 වැනි දින මූලික විරෝධතාවයක් පාමින් 2008.03.31 වැනි දින සිට වගඋත්තරකාර සමාගම සමඟ සම්බන්ධයක් නොමැති නිසා ස්වාමි සේවක සම්බන්ධයකින් තොරව කාර්මික ආරවුලක් ඇති විය නොහැකි බවට තර්ක කරන ලදී.

ඉල්ලුම්කරු විසින් ලකුණු කරන ලද ඉ2 දරන ලේඛනය වූ කලී වගඋත්තරකාර සමාගම ඉල්ලා අස්වීම භාරගත් බවට එවන ලද ලිපියයි. ඒ ලිපිය අනුව ඉල්ලා අස්වීම ක්‍රියාත්මක වන්නේ 2008.04.17 වන දින සිට බව පැහැදිලිය. ඒ අනුව ඉල්ලුම්කරු සහ වගඋත්තරකාර සමාගම අතර සේව්‍ය ස්වාමී සම්බන්ධය නොනැසී පැවතුණි. මූලික විරෝධතා ප්‍රතික්ෂේප කරමින් විමසීම් ආරම්භ කරන ලදී.

නඩු විභායේදී ඉල්ලුම්කරු විසින් ඉ(1) සිට ඉ(7) දක්වා ද වග උත්තරකරු වා1 සිට වා17 දක්වා ද ලේඛන ලකුණු කරන ලදී. විමසීම් අවසානයේ දී දෙපාර්ශවය විසින් ලිඛිත සැලකිළි ගොනු කරන ලදී.

ඉදිරිපත් වූ සාක්ෂි ලේඛන හා නීතිමය තත්වය සලකා බැලීමේදී ඉල්ලුම්කරු 2008.03.03 වැනි දින 2008 අප්‍රේල් 17 වැනි දින සිට සේවයෙන් ඉවත් වන බවට කරන ලද දැන්වීමට වගඋත්තරකාර ආයතනය 2008.03.31 වැනි දින පිළිතුරු ලිපියක් එවමින් ඉල්ලා අස්වීම භාර ගන්නා බවත් එය ක්‍රියාත්මක වන්නේ දිනය 2008 අප්‍රේල් 17 වන ද සිට බවට ප්‍රකාශයක් ද සේවා කාලය තුළ කරන ලද සේවයේ ඇගයීමක් ද අනාගතය පිළිබඳ සුභ පැතීමක් ද දක්වා ඇත. මේ කරුණු සලකා බැලීමේ දී වගඋත්තරකාර පාර්ශවය ඉල්ලුම්කරුට හිඟ බෝනස් මුදල රු. 52,500/- ක් ගෙවිය යුතු බවට තීරණය කිරීම සාධාරණ හා යුක්ති සහගත බව මගේ හැඟීමයි.

### ප්‍රදානය

1) ඉල්ලුම්කරු වෙත ඔහුට හිමි බෝනස් මුදල වන රුපියල් පනස් දෙදහස් පන්සියය (රු. 52,500/-) ක මුදලක් ලබාදිය යුතු බවට නියෝග කරමි.

2) ඉල්ලුම්කරුට විමසීම සඳහා වැයවූ ගාස්තුව වෙනුවෙන් රුපියල් 75,000ක් ද වගඋත්තරකරු විසින් ගෙවිය යුතු බවට නියෝග කරමි.

### සටහන

මෙම නඩුව විමසීමේදී ඉල්ලුම්කාර පක්ෂය සහ වගඋත්තරකාර පක්ෂය විවිධ හේතු මත දිනයන් ලබාගෙන ඇති අතර එම හේතුව විභාගය ප්‍රමාද වීමට හේතුවක් වුව ද ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් පමා වීමට හේතු වුයේ පසුගිය කාලය තුළ පැවති බලවත් අවිවේකී තත්ත්වය සහ රාජකාරී කටයුතු වල බහුලව යෙදීම බවත් සඳහන් කරමි. එකී හේතු මත ප්‍රමාදය සම්බන්ධයෙන් බලවත් සේ කණගාටුවට පත් වෙමි.

එස්. එම්. එස්. ජයවර්ධන,
බේරුම්කරු,

2019.06.27 වැනි දින,
කාර්මික අධිකරණයේ දී ය.

09 - 15

*මගේ අංකය* : IR/10/03/2012

**කාර්මික ආරාවුල් පනත - 131 වැනි අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික අරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2013.06.06 දිනැති හා අංක 1813/21 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2013.05.03 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කැගල්ල, පානකාව, පොල්ගහවෙල පාර, සෝමරත්න කඩේ බාරේ හි පදිංචි කේ. පී. වික්‍රමනායක මයා සහ කැළණිය, වේවැල්දූව, අංක 14හි පිහිටි කැළණි කේබල්ස් ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2019.06.27 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 අගෝස්තු මස 09 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

*යොමු අංකය* : IR/10/03/2012

කාර්මික අධිකරණය

1. කේ. පී. වික්‍රමනායක මයා,
අංක 1ඒ/12,
ජයවඩනගම,
බත්තරමුල්ල.

*පළමු පාර්ශවය*

නඩු අංකය : A 3512

*සහ*

කැළණි කේබල්ස් ලිමිටඩ්,
අංක 14, වේවැල්දූව,
කැළණිය.

*දෙවන පාර්ශවය*

අතර පවත්නා කාර්මික ආරාවුල

**ප්‍රදානය**

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගාමිණී ලොකුගේ මැතිතුමා විසින් වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 4 සහ 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමාට පැවරී ඇති බලතල ප්‍රකාරව උක්ත ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරිම සඳහා 2013.05.03 දිනැති නියෝගයෙන් බේරුම්කරුවෙකු වශයෙන් මා පත්කොට මා වෙත යොමුකර ඇත.

**ආරවුලට තුඩුදුන් කාරණය**

බේරුම්කරණය සඳහා මා වෙත යොමු කොට උක්ත නියෝගය ප්‍රකාරව ඉහත සඳහන් දෙපාර්ශවය අතර උද්ගත වී ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කාරණය ලෙස 1988.11.25 දින සිට කැළණි කේබල්ස් ලිමිටඩ් ආයතනයේ වැද්දුම්කරුවෙකු ලෙස සේවය කර ඇති කේ. පී. වික්‍රමනායක මහතාගේ සේවය 2005.11.23 දින තහනම් කිරීම තුළින් හා 2006.10.19 දින විනය පරීක්ෂණයක් පවත්වා 2005.11.24 දිනයෙන් වලංගු වන පරිදි සේවයෙන් පහ කිරීම තුළින් ඔහුට යම් අසාධාරණයක් සිදුවී ඇත් ද ? එසේ අසාධාරණයක් සිදුවී ඇත්නම් හිමි විය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ.

**පසුබිම**

2013.06.17 වැනි දින කාර්මික අධිකරණය වෙත මුල් ප්‍රකාශය ඉදිරිපත් කරන අතර 2013.06.22 වැනි දින දෙවන පාර්ශවය විසින් පිළිතුරු ඉදිරිපත් කරන ලදී. 2013.07.12 වැනි දින ඉල්ලුම්කරු විසින් දෙවන පාර්ශවයේ ප්‍රකාශයට පිළිතුරු සපයන ලදී. 2013.07.25 වැනි දින මුල් වරට විමසීමට ගත් අවස්ථාවේදී දෙපාර්ශවය විසින්ම තවදුරටත් කරුණු සලකා බැලීම සඳහා දින ලබා ගන්නා ලදී. මුලදී ප්‍රකාශ ඉදිරිපත් කර ඇත්තේ නිසි නීති උපදෙස් නොමැති බැවින් 2013 සැප්තැම්බර් මස 12 වැනි දින ඒ. එම්. ධර්මපාල මහතා මගින් පළමු පාර්ශවය වෙනුවෙන් ප්‍රති උත්තරයක් ගොනු කරන ලදී.

2013.09.23 වැනි දින වගඋත්තරකාර පාර්ශවය රුපියල් අසූ දහස් අටසිය විසි හය (රු. 80,826/-) ක මුදලක් ද මාස 06ක වැටුප් ලෙස පනස් හත්දහස් පනස් හතර (රු. 57,054/-) ක් ද එකතු කළ විට රුපියල් එක්ලක්ෂ තිස්හත් දහස් අටසිය අසූව (රු. 137,880/-) ක් පූර්ණ හා අවසාන සමතයක් ලෙස ගෙවීමට යෝජනා කරන ලදී. මේ අවස්ථාවේදී එකී මුදල රුපියල් එක්ලක්ෂ පනස් දහස (රු. 150,000/-) දක්වා වැඩි කිරීමට හැකියාව ඇත්දැයි මා විසින් අසන ලදී. ඉල්ලුම්කාර පාර්ශවය වෙනුවෙන් පෙනී සිටි හේමචන්ද්‍ර කුලරත්න මහතා එය රුපියල් දෙලක්ෂ පනස් දහස (රු. 250,000/-) දක්වා වැඩි කිරීමේ හැකියාව ගැන සලකා බලන ලෙස ඉල්ලා සිටියේ ය. දෙපාර්ශවය විසින් ම මීළඟ දිනයේ දී තීරණයක් ගන්නා බව දැනුම් දුනි.

2013.11.04 වැනි දින වගඋත්තරකාර පක්ෂය වෙනුවෙන් නීතිඥ ප්‍රසාද් සිල්වා මහතා රුපියල් දෙලක්ෂය (රු. 200,000/-) ක මුදලක් පූර්ණ හා අවසාන වශයෙන් ගෙවීමට කැමැත්ත පළ කරන ලදී. ඉල්ලුම්කරු එකී සමථය පිළිගැනීමට එකඟ විය. 2013.11.13 වැනි දින ඉල්ලුම්කරු පෞද්ගලිකව පෙනී සිටි අතර වගඋත්තරකාර

පාර්ශවය වෙනුවෙන් මානව සම්පත් කළමනාකරු ගිහාන් විදනගමගේ මහතා පෙනී සිටියදී මුලින් ඇති කරගත් සමථය ප්‍රකාරව සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ ප්‍රධාන කාර්යාලයේ අංක 111986 දරන 2013.11.12 දිනැති රුපියල් ලක්ෂ දෙක (රු. 200,000/-) ක චෙක්පත ඉල්ලුම්කරු වෙත භාර දුනි.

**ප්‍රදනය**

දෙපාර්ශවය විසින් ඇති කරගන්නා සමථය ප්‍රකාරව බේරුම්කරණයට අදල ඉල්ලීම සම්බන්ධ පූර්ණ හා අවසාන ගෙවීමක් ලෙස රුපියල් ලක්ෂ දෙක (රු. 200,000)ක් වටිනා චෙක්පත ඉල්ලුම්කරු වෙත ප්‍රදනය කරමි. මෙම බේරුම්කරණය සම්බන්ධයෙන් මෙම තීරණය සාධාරණ සහ යුක්ති සහගත බැව් වැඩිදුරටත් ප්‍රකාශ කරමි.

එස්. එම්. එස්. ජයවර්ධන,
බේරුම්කරු,

2019.06.27 වැනි දින,
කාර්මික අධිකරණයේ දී ය.

09 - 16

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.